07-10-2025 උදෑසන මුරලි ඕම් ශාන්ති බාප්දාදා මධුබන්

**සාරය:** සුමිහිරි දරුවනි, නොයෙකුත් ක්‍රම සහ විධි ඉදිරියෙහි තබා ගෙන ස්මරණය නම් වූ වන්දනා ගමනෙහි යෙදී සිටින්න. මේ පැරණි ලෝකය අමතක කර දමන්න. ඔබගේ සුමිහිරි නිවසත් නව ලෝකයත් සිහිපත් කරන්න.

**ප්‍රශ්නය:** මේ කාලයේදී පමණක් සිදු වන, චක්‍රය තුළ වෙන කිසිම අවස්ථාවකදී සිදු නොවන ක්‍රියාව සහ උත්සාහය කුමක්ද?

**පිළිතුර:** ස්මරණය නම් වූ වන්දනා ගමනෙහි යෙදී ජීවාත්මය පාරිශුද්ධත්වයට පත් කිරීමත් මුළු ලෝකයම පාරිශුද්ධත්වයට පත් කිරීමත් සිදු වන්නේ මෙම සංගම් යුගයේදී පමණයි. සෑම චක්‍රයකදීම මෙම ක්‍රියාව නැවත නැවතත් සිදු වෙනවා. මේ සදාකාලික හා අවිනාශී වූ නාටකය පිළිබඳ වූ අසිරිමත් රහස කුමක්ද කියා දරුවන් වන ඔබට තේරෙනවා.

ඕම් ශාන්ති. ආධ්‍යාත්මික පියා මෙහි අසුන් ගෙන ඔබ ආධ්‍යාත්මික දරුවන්ට විස්තර කර කියා දෙනවා. මේ නිසා තමයි ආධ්‍යාත්මික දරුවන් ජීව අවධානයෙන් ආධ්‍යාත්මික තත්ත්වයකින් අසුන් ගෙන ඔහු කෙරෙහි ඇති විශ්වාසයෙන් ඔහුට සවන් දිය යුතු වන්නේ. පියා විස්තර කර තිබෙනවා: ජීවය තමයි ඉන්ද්‍රිය මාර්ගයෙන් සවන් දෙන්නේ. මෙය ඉතා ස්ථිර ලෙස සිහියෙයි තබා ගන්න. ඔබ සෑම කෙනෙක්ම මේ ගැලවීමේ හා විනාශයෙහි චක්‍රය තම බුද්ධියෙහි තබා ගත යුතුයි. දැනුම හා වන්දනාව මෙයට අඩංගු වෙනවා. ඇවිදින විටත් වැඩක යෙදී සිටින විටත් බුද්ධියෙහි මෙය තබා ගන්න. දැනුම හා වන්දනාවත්, සතුට හා දුකෙහිත් ක්‍රීඩාව දිවා රාත්‍රී සිදු වන්නේ කෙසේද? අපි අපගේ උපත් 84 ක චක්‍රය මෙහිදී රඟපානවා. පියා සියලු දේ සිහියෙහි තබාගෙන සිටින අතර රාජ්‍යය ලබා ගැනීමට හැකි වෙනවා. මේ පැරණි ලෝකය දැන් විනාශ වීමට යන බව ඔබ දන්නවා. නිවස පැරණි වන විට අලුත් නිවසක් ඉදි වන බව ඔබ දන්නවා. එමෙන්ම ඉතා ඉක්මනින්ම එම නිවහනට යන බවත් ඔබ දන්නවා. කොහොම නමුත්, අලුත් නිවහනක් තනා නිම කිරීමට අවුරුදු දෙකක්වත් ගත වෙනවා. උදාහරණයක් ලෙස, නව දිල්ලියෙහි ජනාධිපති මන්දිරය ඉදි වන විට ආණ්ඩුව කිව්වා අපි නව දිල්ලියට යනවා කියා. මේ අසීමිත වූ ලෝකය පැරණි බව ඔය දරුවන්ට තේරෙනවා. ඔබ දැන් ඒ නව ලෝකය කරා යා යුතුයි. බාබා ඔබට නොයෙකුත් මාර්ග පෙන්වා දෙනවා: මෙම මාර්ග වලින් ඔබගේ බුද්ධිය ස්මරණය නම් වූ වන්දනා ගමනෙහි නිරත කරවන්න. අපි දැන් නිවහන කරා යා යුතුයි. අන්න ඒ නිසා තමයි අපි අපේ මිහිරි නිවහන සිහිපත් කළ යුත්තේ. මිනිස්සු තම හිස් ගසා ගන්නේ මේ කාර්යයටයි. සුමිහිරි දරුවන් වන ඔබට මේ දුක් සහිත ලෝකය විනාශ වීමට තිබෙන බව විස්තර කර කියා දී තිබෙනවා. මෙම පැරණි ලෝකයෙහි ජීවත් වුවත්, ඔබ එයට කැමති නැහැ. අපි දැන් ඒ නව ලෝකයට යා යුතුයි. භක්ති මාර්ගයේ නොයෙකුත් පින්තූර තිබෙනවා. ඒ හා සසඳා බලන කල ඔබ ළඟ තිබෙන්නේ බොහොම ටිකයි. ඔබ ළඟ තිබෙන්නේ දැනුම් මාර්ගයට අදාල පින්තූර වන අතර ඔවුන් ළඟ තිබෙන්නේ භක්ති මාර්ගයට අයත් පින්තූරයි. සෑම භක්තියක්ම සිදු වන්නේ පින්තූර මඟිනි. කොහොම නමුත්, ඔබ ළඟ තිබෙන්නේ නියම පින්තූරයි. මේ නිසා තමයි නිවැරදි කුමක්ද වැරදි කුමක්ද කියා ඔබට විස්තර කර දිය හැකි වන්නේ. බාබාව හඳුන්වන්නේ දැනුමින් පිරි තැනැත්තා ලෙසයි. ඔබ ළඟ මෙම දැනුම තිබෙනවා. මේ මුළු චක්‍රය පුරාම තමා කෙතරම් උපත් සංඛ්‍යාවක් ලබා තිබෙනවා ද කියා ඔබ දන්නවා. මෙම චක්‍රය කරකැවෙන්නේ කෙසේද කියා ඔබ දන්නවා. නිරන්තරයෙන් පියාගේ සිහියෙහි යෙදී මෙම දැනුමද නිරන්තරයෙන්ම ඔබ හා තබා ගත යුතුයි. පියා මෙම නිර්මාණයෙහිත් එහි නිර්මාණකරුවා පිළිබඳ වූ දැනුමත් ඔබට ලබා දෙනවා. එම නිසා ඔබ පියාවද සිහිපත් කළ යුතුයි. බාබා විස්තර කර තිබෙනවා: මා ඔබගේ පියා, ගුරුවරයා හා සත්ගුරු වෙනවා. ඔබ මට පාරිශුද්ධකරුවා, විමුක්තිදායකයා හා මඟ පෙන්වන්නා කියා කතා කළා කියා බාබා කියනවා යන්න විස්තර කර දෙන්න. මඟ පෙන්වන්නේ කොහාටද? සාමය හා විමුක්තිය වෙත මඟ පෙන්වනවා. පියා ඔබව ගෙන ගොස් එහි දමනවා. දරුවන් වන ඔබට ඔහු උගන්වා, ඔබව උගත් තත්ත්වයට පත් කරවා, ලස්සන කරවා නිවස වෙත ගෙන ගොස් එහි තබවනවා. මහා භූතයන් ගැන හෝ බ්‍රහ්ම ලෝකය ගැන හෝ කෙනෙකුට කෙතරම් වූ දැනුමක් තිබුණද පියා හැර වෙන කිසිම කෙනෙකුට බැහැ ඔබව නිවස වෙත ගෙන යන්න. තමන් බ්‍රහ්ම ලෝකය සමඟ එකතු වෙනවා කියා ඔවුන් සිතනවා. සාම දේශය තමන්ගේ නිවස බව ඔබගේ බුද්ධියේ තිබෙනවා. පළමුව ඔබ ඒ වෙත යන අතර පසුව නව ලෝකය වෙත පැමිණෙන පළමු කණ්ඩායමද ඔබම වෙයි. අනිකුත් ආගම් සියල්ලේම අය පිළිවෙලට ආවේ කෙසේද කියන එක ඔබ දන්නවා. සත් යුගයේදී හා රිදී යුගයේදී තිබෙන්නේ

කාගේ අධිරාජ්‍යයද? ඔවුන්ගේ ආගමික ග්‍රන්ථ මොනවාද?සූර්යය වංශයත් චන්ද්‍ර වංශයත් දෙකටම ඇත්තේ එකම එක ග්‍රන්ථයයි. කොහොම නමුත්, ඔබ දැන් ලබන දැනුම මෙහිදීම අවසන් වන නිසා එම ගීතාව නිවැරදි එකක් නොවෙයි. එහි කිසිම ග්‍රන්ථයක් නැහැ. තඹ යුගයට පසුව පැමිණි ආගම් සියල්ලේම ග්‍රන්ථ දීර්ඝකාලීනව තිබෙනවා. එතැන් සිට ඒවා දිගටම පැමිණෙනවා. දැන් එකම එක ආගමක් ස්ථාපනය වෙමින් තිබෙනා අතර අන් සියල්ල විනාශයට පත් වෙනවා. එකම එක රාජ්‍යයක්, එකම එක ආගමක්, එකම එක භාෂාවක්, එකම එක උපදේශයක් ගැන මිනිස්සු කතා කරනවා. එය ස්ථාපනය කළ හැක්කේ එකම එක් අයෙකුට පමණයි.සත් යුගයේ සිට කලි යුගය දක්වා ඇති සියලුම දේ ඔබගේ බුද්ධියේ තිබෙනවා. පියා කියනවා: දැන් පාරිශුද්ධත්වයට පත් වීමට උත්සාහ දරන්න. අපිරිසිඳු වීමට ඔබ කල්ප භාගයක් ගත්තා. මුළු කල්පයම ගත්තා කියා වුණත් කියන්න පුළුවන්. ස්මරණ වන්දනාවේ සිටීමට ඔබ ඉගෙන ගන්නේ දැනුයි. මෙම අධ්‍යයනය එහි ඇත්තේ නැහැ. අපිරිසිඳු තත්ත්වයේ සිට පිරිසිඳු තත්ත්වයට පත් වීමට දේවතාවරුන් උත්සාහ දරන්නේ නැහැ. කලින්ම රාජයෝගා හදාරා ඔවුන් පාරිශුද්ධත්වයට පත් වුණා. එය සතුටේ දේශය වශයෙන් හැඳින්වෙනවා. ස්මරණ වන්දනාවේ යෙදෙන්න තමන් උත්සාහ දරන්නේ මෙම කාලයේදී පමණක් බව ඔබ දන්නවා. අපිරිසිඳු ලෝකය පිරිසිඳු කිරීමේ කාර්යය නැවත මීළඟ කල්පයේදීත් එනවා. ඔබ අනිවාර්යෙන්ම කල්පය වටා ගමන් කරනවා. මෙය නාටකයක් වන්නේ කෙසේද, සියලුම ජීව අවිනාශී චරිතයකුත් සමග නළුවන් වන්නේ කෙසේද වැනි කරුණු සියල්ල ඔබගේ බුද්ධිය තුළ තිබෙනවා. එය නාටකයක් වගෙයි. නමුත් පැරණි වන විට එම චිත්‍රපටය ගෙවී යනවා. මෙම චිත්‍රපටය අවිනාශීයි. එවන් කුඩා ජීවයක් තුළ මෙතරම් ලොකු චරිතයක් පටිගත වී තිබෙන්නේ කෙසේද කියන එකත් මහා පුදුමයක්. ඉතාමත් ගැඹුරු හා සියුම් දේ සියල්ල පියා ඔබට පැහැදිලි කර කියා දෙනවා. වෙන කවුරු හෝ මේ දේ වලට ඇහුම්කන් දුන්නොත් මෙතන ඉතාමත් පුදුම සහගත දේ කියා දෙනවා කියා කියන්න පටන් ගනියි. ජීවයක් කියන්නේ කුමක්ද කියා අපි දැන් තේරුම් ගෙන සිටිනවා. ශරීරය පිළිබඳව සියලු දෙනාම තේරුම් ගන්නවා. මනුෂ්‍යයකුගේ හදවතක් එළියට ගෙන නැවත එය එලෙසින්ම තබන්න වෛද්‍යවරුන්ට පුලුවන්. කොහොම නමුත්, කිසිම කෙනෙක් ජීවය ගැන දන්නේ නැහැ. ජීවය පාරිශුද්ධ තත්ත්වයේ සිට අපිරිසිඳු වුණේ කොහොමද කියන එකවත් කවුරුවත් දන්නේ නැහැ. අපිරිසිඳු ජීවයක්, පිරිසිඳු ජීවයක් හා උසස් ජීවයක් ගැන ඔවුන් කතා කරනවා. ඕ පාරිශුද්ධකරුවාණෙනි, පැමිණ මා පාරිශුද්ධත්වයට පත් කරවන්න කියා සියලු දෙනාම කෑ ගසනවා. කොහොම නමුත්, ජීවයක් පාරිශුද්ධ වන්නේ කෙසේද? මේ සඳහා සදාකාලික වූ ශල්‍ය වෛද්‍යවරයා අවශ්‍ය වෙනවා. ඉපදීමක් නැති කෙනාට ජීව කතා කරනවා. ජීවය පාරිශුද්ධත්වයට පත් කරවීමේ බෙහෙත ඇත්තේ ඔහු ළඟ පමණයි. සත්‍යය ඔබට උගන්වනවා යන සතුට දරුවන් වන ඔබ තුළ තිබිය යුතුයි. ඔහු අනිවාර්යෙන්ම ඔබව දිව්‍ය දිව්‍යාංගනාවන් බවට පත් කරවාලයි. භක්ති මාර්ගයේදී ලක්ෂ්මී හා නාරායන් දිව්‍යාංගනාවන් වශයෙන් හඳුන්වනවා. රජත් රැජිණියත් කෙසේ සිටිනවාද පුරවැසියනුත් ඒ ආකාරයේම වෙනවා. ඔහු ඔබව ඔහු ලෙසින්ම පාරිශුද්ධ කරවනවා. ඔහු ඔබව දැනුමේ සාගර බවට පත් කරවා ඉන් අනතුරුව ඔහුටත් වඩා උසස් අය බවට පත් කරවනවා. ඔහු ඔබව ලෝක පාලකයින් බවට පත් කරවනවා. පාරිශුද්ධත්වයට පත් වීමේ හා අපිරිසිඳු වීමේ නාටකය ඔබ රඟපෑ යුතුයි. ආදි සනාතන දේවි දේවතා ධර්මය ස්ථාපනය කිරීම සඳහා බාබා නැවතත් පැමිණෙන බව ඔබ දන්නවා. ආගම දැන් විනාශ වෙලා කියා කියන්නේ මෙම ආගම සම්බන්ධවයි. කඳක් නොමැති නමුත් අතු රාශියක් ඇති නුග ගසක් හා එය සම්බන්ධ කරනවා. මෙහිත් විවිධ ආගම් නම් වූ අතු රාශියක් බිහි වී තිබෙන නමුත් පදනම වන ආදි සනාතන දේවි දේවතා ධර්මය තවදුරටත් ඉතිරිව නැහැ: එය අතුරුදහන් වෙලා. පියා කියනවා: එම ආගම තවමත් තිබෙනවා. නමුත් ඔවුන් එහි නම වෙනස් කරලා. ඔවුන් තවදුරටත් අපිරිසිඳු අය නොවන නිසා දේවතාවරුන් කියා හඳුන්වන්න බැහැ. තවදුරටත් එය නැති නිසා තමයි පියා පැමිණ එය නිර්මාණය කළ යුතු වන්නේ. තමන් පිරිසිඳු දේවතාවරුන් වශයෙන් සිටි බව ඔබ දන්නවා. දැන් ඔබ අපිරිසිඳු වෙලා. සියලු දේටම එය අදාලයි. දරුවන් වන ඔබ මෙය අමතක නොකළ යුතුයි. පළමු හා ප්‍රධානතම ඉලක්කය වන්නේ ඔබ පාරිශුද්ධත්වයට පත් කරවන පියාව සිහිපත් කිරීමයි. සියලු දෙනාම කියනවා: පාරිශුද්ධකරුවාණෙනි, පැමිණෙන්න, රජයෙක් හෝ රැජිණක් බවට පත් කරවන්න කියා ඔවුන් ඉල්ලන්නේ නැහැ. එම නිසා, දරුවන් වන ඔබ තුළ ලොකු සතුටක් තිබිය යුතුයි. තමන් සත්‍යයේ දරුවන් බව ඔබ දන්නවා. අපි අනිවාර්යෙන්ම අපේ උරුමය ලබා ගත යුතුයි. කල්පයක් කල්පයක් පාසා ඔබ මෙම කොටස රඟපා තිබෙනවා. ගස දිගටම වර්ධනය වෙනවා. බාබා ඔබට සියලුම පින්තූරත්, මෙම පින්තූරය විමුක්තියේ පින්තූරයක් වන්නේ කෙසේද කියන එකත් පැහැදිලි කර කියා දී තිබෙනවා. කතා කිරීමෙන් මෙන්ම පින්තූර මඟිනුත් පැහැදිලි කර දිය හැකියි. ලෝකයේ මුල, මැද හා අග පිළිබඳ වූ සියලුම රහස් මෙම පින්තූර වල තිබෙනවා. අන් අයවත් තමා හා සම අය බවට පත් කරවීම සඳහා

දරුවන් වන ඔබ සේවය කරනවා. වැඩියෙන් ඉගෙන ගත් තරමට ඔබ ලබන තත්ත්වය වඩාත් උසස් වෙනවා. පියා කියනවා:උත්සාහ දැරීමට මම ඔබව උනන්දු කරවනවා. නමුත් එය ඔබගේ වාසනාවේත් තිබිය යුතුයි. නාටකයේ හැටියට සියලු දෙනාම උත්සාහ දරනවා. නාටකයේ රහස් ගැන පියා ඔබට කියා දී තිබෙනවා. ඔහු ලියා වෙනවා වගේම ගුරුවරයාත් වෙනවා. ඒත් සමගම ඔබව නැවතත් නිවස කරා ගෙන යන නියම සත්ගුරුද වෙනවා. පියා අමරණීය වූ කෙනෙක්. තමාට අයිති චරිතය රඟපාන මෙම ජීවයේ සිහසුන වන්නේ මෙයයි. තමාට අයිති කොටස රඟපෑමටත් විමුක්තිය ලබා දීමටත් පියාට වුණත් සිහසුනක් අවශ්‍ය වෙනවා. පියා කියනවා: මම සාමාන්‍ය ශරීරයකට ඇතුල් විය යුතුයි. කිසිම ආකාරයක අනවශ්‍ය වූ ශෝභාවක් මට නැහැ. වෙනත් ගුරුවරුන්ගේ අනුගාමිකයින් තම ගුරු සඳහා රනින් කළ සිහසුන් තබාගෙන ඉන්නවා. ඔවුන්ට මාළිගා ආදියත් තිබෙනවා. ඔබ මොනවා ද නිර්මාණය කරන්නේ? ඔබ දරුවන් වන අතර ශිෂ්‍යයින් ද වෙනවා. ඉතින්, ඔබ ඔහුට මොනවා ද කරන්නේ? එය නිර්මාණය කරන්නේ කොහිද? මොහු සාමාන්‍ය කෙනෙක්. දරුවන් වන ඔබ ගණිකා වෘත්තියේ යෙදෙනා අයට පවා සේවය කළ යුතුයි යන්න පැහැදිලි කර කියා දී තිබෙනවා. දුප්පත් අයවත් නගා සිටුවිය යුතුයි. දරුවන් වන ඔබලා මේ දේ කිරීමට උත්සාහ දරනවා. ඔබලා බරණැසට පවා ගොස් තිබෙනවා. ඔවුන්ව හොඳ මගකට හැරෙව්වොත් මිනිස්සු කියාවි බ්‍රහ්ම කුමාරීන් හරිම අරුම පුදුම දේවල් කරනවා කියා. ඔවුන් ගණිකාවන්ට පවා දැනුම දෙනවා කියා කියාවි. ඒ ව්‍යාපාරය අත්හැර දමා ශිවාගේ දේවාලයේ අසුන් ගත හැකි අය බවට ඔබත් පත් විය යුතුයි කියා ඔවුන්ට පැහැදිලි කර කියා දෙන්න. මෙම දැනුම හොඳින් ඉගෙන ගෙන අන් අයටත් උගන්වන්න. ගණිකාවන්ට පුළුවනි පසුව එය තවත් අයට කියා දෙන්න. මෙය හොඳින් ඉගෙන ගෙන දක්ෂ අයෙක් වූ විට, ඉහළ නිලධාරීන්ට පවා මෙය පැහැදිලි කර කියා දිය හැකියි. ශාලාවක පින්තූර තබාගෙන පැහැදිලි කර කියා දෙන්න. සෑම කෙනෙක්ම: ගණිකාවන්ට පවා ශිවාලයේ සේවාසිකයන් බවට පත් කරවීමට බ්‍රහ්ම කුමාරීන්ට හැකි වීම මහත් පුදුමයක් කියා කියාවි. සේවය සම්බන්ධයෙන් එවන් සිතිවිලි ඔබ තුළ තිබිය යුතුයි. ඔබට විශාල වගකීමක් තිබෙනවා. ගල් බුද්ධියක් ඇති අයව, දුබලයින්ව, දේශකයන්ව හා කිසිම ගුණවත්කමක් නැති අයව පවා ඔබ නඟා සිටුවිය යුතුයි. සන්‍යාසිවරුන්ව පවා නඟා සිටුවා ඇති බව සඳහන් වෙනවා. එය සිදු වන්නේ අවසානයේ දී බව ඔබ දන්නවා. ඔවුන් දැන්ම පැමිණ ඔබට අයිති වෙනවා නම්, භක්ති මාර්ගයත් අවසන් වෙනවා. විප්ලවයක් සිදු වේවි. සන්‍යාසීන් තමා පරාජයට පත් වූ බව කියමින් තම ආශ්‍රම අතහැර දමා යනවා. එය සිදු වන්නේ අවසානයටයි. බාබා නොනවත්වාම සේවය කරන්නේ කෙසේද කියා ඔබට උපදෙස් ලබා දෙනවා. බාබාට වෙන කිසිම පිටත තැනකට යන්න බැහැ. පියා කියාවි: ගිහින් දරුවන්ගෙන් ඉගෙන ගන්න. ඔහු පැහැදිලි කිරීමේ විවිධ මාර්ගත් ඔබට පෙන්වා දෙනවා. මිනිසුන්ට ඔබගේ ගුණ ගායනා කළ හැකි ආකාරයේ කාර්යයන් කරන්න. දෙවියන් ශක්තීන්ලාව දැනුමේ ඊතලයෙන් පිරවූ බව සඳහන් වෙනවා. මේ දැනුමේ ඊතලයයි. මෙම ඊතලය ඔබව මේ ලෝකයෙන් එහාට ගෙන යන බවඔබ දන්නවා. එම නිසා, දරුවන් වන ඔබලාට ඉතාමත් හොඳ දුර දැකීමේ ඥානයක් තිබිය යුතුයි. එකම එක තැනකදී හෝ ඔබගේ නම ප්‍රශංසාවට ලක් වුණොත් ආණ්ඩුව ඒ ගැන දැන ගතහොත්, ඔබගේ බලපෑම ඉතාමත් හොඳින් පැතිරේවි. එක් තැනකින් නිලධාරීන් පස් හය දෙනෙක් මතු වුණොත් එය පුවත්පත් වල පවා පළ වේවි. ඔවුන කියාවි: බ්‍රහ්ම කුමාරීන් ගණිකාවන්ව එම වෘත්තියෙන් මුදවාගෙන ඔවුන්ව ශිවාලයේ වැසියන් බවට පත් කරවනවා. ඉතාමත් ඉහළින් ඔබව වර්ණනා කෙරේවි. ඔවුන් තමා සතු මුදල් සියල්ලමත් ගෙන ඒවි. ඒ මුදල් වලින් ඔබ මොනවාද කරන්න යන්නේ? ලොකු මධ්‍යස්ථාන විවෘත කරාවි. නොයෙකුත් ආකාරයේ පින්තූර ආදිය තැනීමට ඒ මුදල් යෙදවිය හැකියි. මිනිස්සු ඒවා දැක පුදුමයට පත් වේවි. ඔවුන් කියාවි: පළමු ත්‍යාගය හිමි විය යුතු අය වන්නේ ඔබලායි කියලා. ඔවුන් ඔබලාගේ පින්තූර පාර්ලිමේන්තුවට පවා ගෙන යාවි. ඔවුන් එයට ආදරය කරන්න පටන් ගනීවි. සාමාන්‍ය මනුෂ්‍යයින් දේවතාවරුන් බවට පත් කරවීමේ ආශාවක් ඔබ තුළ තිබිය යුතුයි. මීට පෙර කල්පයේ මෙම දැනුම ගත් අය නැවතත් පැමිණ දැනුම ලබා ගනීවි. සෑම ධනයක්ම ආදිය අත්හැර ඒමට දැඩි උත්සාහයක් දැරිය යුතුයි. බාබා පැහැදිලි කර දී තිබෙනවා: මට මගේ ගෙදර මිතුරන් හෝ ඥාතීන් මතක නැහැ. මට මොනවද මතක? පියාත් දරුවන් වන ඔබලාත් හැරෙන්න වෙන කිසිම කෙනෙක් මට මතක නැහැ. මම සෑම දෙයක්ම මාරු කර හමාරයි. වෙන කොහාටද මගේ සිහිය යන්නේ? මම මේ රථය පියාට දී තිබෙනවා. මමත් ඔබලා වගේම ඉගෙන ගන්නවා. මම මේ රථය බාබාට ණයට දී තිබෙනවා. පළමුවෙන්ම අප සූර්ය වංශික දේශය වෙතට යාමට උත්සාහ දරනා බවඔබ දන්නවා. සාමාන්‍ය මනුෂ්‍ය තත්ත්වයෙන් නාරායන් කෙනෙක් බවට පත් වීමේ කතාවයි මේ. තෙවෙනි ඇස ලැබෙන්නේ ජීවයන්ටයි. මම නම් වූ මෙම ජීවය දේවතාවරයෙක් බවට පත් වීම සඳහා මෙම දැනුම ඉගෙන ගන්නවා. එවිට මම රජවරුන්ගෙත් රජ කෙනෙක් බවට පත් වේවි. ශිව බාබා කියනවා: මම ඔබලාව කිරුළු දෙකක් ඇති අයෙක් බවට පත් කරවනවා. ඔබගේ බුද්ධිය දැන් නාටකයට අනුව

මීට පෙර කල්පයේදී සිදු වුණු ආකාරයෙන්ම හොඳින් විවෘත වී තිබෙනවා. දැන් ඔබ ස්මරණ වන්දනාවේ නිරත විය යුතුයි. ලෝක චක්‍රයත් කරකැවිය යුතුයි. පැරණි ලෝකය ඔබගේ සිහියෙන් ඉවත් කර දමන්න. අච්චා.

සුමිහිරි, ආදරණීය, බොහෝ කලක් නැති වී සිට දැන් හමු වුණ දරුවන්ට ඔබගේ මව, පියා, බාප්දාදා සෙනෙහසින් සිහිපත් කර සුබ උදෑසනක් ප්‍රාර්ථනා කරයි. ආධ්‍යාත්මික පියාගෙන් ආධ්‍යාත්මික දරුවන්ට නමස්කාර.

**ධාරණය සඳහා සාරාංශය:**

1. ඔබ වෙනුවෙන් නව ස්ථාපනයක් සිදු වෙමින් පවතින බව ඔබේ බුද්ධියේ තබා ගන්න. මෙම පැරණි දුක්ඛිත ලෝකය දැන් අවසන් වීමට ආසන්නයි. ඔබ මේ ලෝකයට කිසිසේත් කැමති නොවිය යුතුයි.
2. බාබා තමා සතු සෑම දෙයක්ම හුවමාරු කර ගත් නිසා ඔහුගේ සිහිය වෙන කොහාටවත් ඇදී යන්නේ නැහැ. එමනිසා, පියාව අනුගමනය කරන්න. සාමාන්‍ය මිනිසුන්ව දේවතාවරුන් බවට පත් කරවන්නේ කෙසේද, ගණිකා මඩම ශිව දේවාලයක් බවට පත් කරවන්නේ කෙසේද යන්න ගැන පමණයි ඔබ තුළ තිබිය යුතු එකම එක ආසාව විය යුත්තේ.

**වරදානය:** රාජකීය ස්වරූපයේ ශරීර අවධානය අවසන් කරන්නේ කවුරුන්ද කියා ඔබ දකින අතර නොබැඳි නරඹන්නෙක් වේවා.

අන් අයගේ අදහස් වලට ගරු නොකිරීම හෝ ඔවුන්ව කපා දැමීම, ශරීර අවධානයේ රාජකීය ස්වරූපයකි. එය ඔබ ලවා තමන්ට සහ අන් අයට අපහාස කරවයි. මෙයට හේතුව වන්නේ, අන් අයව කපා දමන කෙනෙකුට අහංකාරකම තිබෙන අතර ඔහු කපා දැමූ කෙනාට අපහාසයක් දැනෙයි. එබැවින් ඔබ සෑම සිතිවිල්ලක් නිර්මාණය කරන විට සහ සෑම ක්‍රියාවක්ම සිදු කරන අතර නොබැඳි නරඹන්නෙක් වීමේ ආශිර්වාදය ඔබගේ අවධානයේ තබා ගන්න. නාටකයේ පළිහ අත දරා, නාටකයේ රේල් පීලි මත රැඳී සිට මෙම රාජකීය ස්වරූපයේ 'මම' අවසන් කර සියලු දෙනාටම ගෞරවය සහ සෙනෙහස ලබා දෙන්න. එවිට ඔවුන් සෑම කලටම ඔබට සහයෝගය ලබා දෙයි.

**පාඨය:** පරමාත්ම දෙවියන්ගේ ශ්‍රීමත් ජලයේ පදනමට අනුව ක්‍රියාවේ බීජය බලවත් කරගන්න.

***** ඕම් ශාන්ති *****

**අව්‍යාක්ත සංඥාව: යෝගා බලයෙන් ඔබගේ මනසින් තමන් මත සහ අන් අය මත පර්යේෂණ සිදු කරන්න.**

සෑම මොහොතකම, ඔබ සහ අන් සෑම ජීවාත්මයක්ම සුබ පැතුම් සහ පිරිසිදු හැඟීම් වල පවිත්‍ර කම්පන නිරායාසයෙන්ම අත්විඳිය යුතුය. සෑම මොහොතකම, සියලු ජීවාත්ම සඳහා ඔබේ මනසින් ආශිර්වාද සෑම විටම මතු වේවා. වචන තුළින් සේවය කිරීමේ කාර්යබහුලව සිටීමේ අත්දැකීම් ඔබ ලබා ඇති ආකාරයටම, මෙම සේවය කිරීමේ දී ඔබේ මනස නිරන්තරයෙන් කාර්යබහුලව තබා ගන්න. ඔබට කිසිදු සේවාවක් ලබා නොදෙන විට, ඔබ හිස් බවක් අත්විඳියි. එවිට වචන තුළින් සේවය කරන ආකාරයටම, ඔබේ මනසින් සේවය කිරීම ඉබේම සිදුවීමට ඉඩ දෙන්න.